# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 107/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 21/01/2024 පැය1145

# මාධ්‍ය නිවේදනය

**ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව - කොළඹ මධ්‍යම කොට්ඨාසය.**

කොළඹ මධ්‍යම කොට්ඨාසයේ ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව 2024.01.20 වන දින මහජන ආරක්ෂාව පිළිබඳ ගරු අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ගරු ලේකම් වියානි ගුණතිලක මහතා, වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සහ හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාගේ සහභාගිත්වයෙන් මාලිගාවත්ත, පී.ඩී සිරිසේන ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

ගරු මහජන ආරක්ෂක ටිරාන් අලස් මහතා උත්සවය අමතමින් **'සංවිධානාත්මක අපරාධ කල්ලි සහ කුඩු ජාවාරම්කාරයන් සම්බන්ධ බිය මෙරටින් තුරන් කිරීමට ඇප කැප වී යුක්තිය මෙහෙයුම නොකඩවා ක්‍රියාත්මක කරන'** බවට ප්‍රකාශ කර ඇති අතර වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාද තම අදහස් දක්වමින් **'රටෙහි දෙමව්පියන්ගේ සිත් තුල තම දරුවා මත්ද්‍රව්‍ය වලට යොමු වේ යැයි බිය පහව යන තෙක්'** මෙම මෙහෙයුම නොනවත්වා ක්‍රියාත්මක කරන බවයි. කොළඹ මධ්‍යම කොට්ඨාසයේ යුක්තිය මෙහෙයුම සඳහා සම්බන්ධ වූ නිලධාරීන් අගයා ඔවුනට මුදල් ත්‍යාග හා ප්‍රශංසා පිරිනමන ලද අතර යුක්තිය මෙහෙයුම අගය කරමින් සිවිල් සංවිධාන සාමාජිකයින් විසින් ගරු අමාත්‍යතුමා, ලේකම්තුමා හා පොලිස්පතිතුමා වෙත සමරු තිළිණ පිරිනමන ලදි.

මෙම අවස්ථාවට පොලිස් විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර, ප්‍රජා පොලිස් හා සංචාරක දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහේෂ් සේනාරත්න, කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍රකුමාර හා ප්‍රජා පොලිස් කොට්ඨාසයේ අධ්‍යක්ෂ ඩී.කේ. ප්‍රියන්ත යන මහත්වරුන් ඇතුළු පිරිසක් සහභාගි විය.